ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව

අනුරාධපුර දිස්ත්‍රික්කය

------------------------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයා වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ,මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ ආදායම් රු.200,332 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) ග්‍රාමීය යටිතල පහසුකම්, පළාත් සභා සහ ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන්වල ව්‍යාපෘති 02 ක් වෙනුවෙන් ගෙවිය යුතු වූ රු.691,598 ක් වෙනුවට රු.783,458 ක් ණයහිමියෝ ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ජංගම වගකීම් රු.91,860 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ බලපත්‍ර ගාස්තු ආදායම රු.813,755 ක් වුවත් එය ආදායම් වියදම් ගිණුමේ රු.579,255 ක් ලෙස දැක්වීම හේතුවෙන් ආදායම් රු.234,500 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ඉදිකර සභාවට භාරදී තිබූ ව්‍යාපෘති 02 ක වටිනාකම ප්‍රාග්ධනිත කිරීමේදී ස්ථාවර වත්කම් රු.1,954,129 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාල ජල ගාස්තු ආදායම් රු.403,772 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු බැවින් වර්ෂයේ ආදායම එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2017 වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.2 අසම්භාව්‍ය බැරකම්

සමාලෝචිත වර්ෂය අවසානයට පොකුණු ව්‍යාපෘතියට අදාලව ගෙවිය යුතු මුදල රු.2,792,119 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර තිබුණද නෛතික ගාස්තු සමග ගෙවීමට ඇති බැරකම රු.4,245,707 ක් ලෙස සභාව සකස් කර ඇති වාර්තාවට අනුව අනාවරණය විය. ඒ අනුව තවදුරටත් ගෙවීමට ඇති රු.1,453,588 ක් සම්බන්ධව මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබුණි.

1.3.3 නොසැසඳුණු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ මුද්දර ගාස්තු රු. 1,229,846 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ නමුත් එය ගිණුම් සටහන් අනුව රු.730,746 ක් ලෙස හා ප්‍රා.ස. 07 වාර්තාව අනුව රු. 698,346 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) වරිපනම් ලේඛන, ඊට අදාල ගිණුම් සහ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ වටිනාකම් අතර රු.1,888,252 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා චංචල වත්කම් කුලියට දීමෙන් උපයා තිබූ ආදායම, ගිණුම් අනුව රු.4,266,217 ක් වුවද ගිණුම් සටහන් අනුව එය රු.4,310,217 ක් වීමෙන් රු.44,000 ක වෙනසක් විය.

(ඈ). සමාලෝචිත වර්ෂයේ බර වාහන යන්ත්‍රවල ආදායම් සම්බන්ධයෙන් වූ ගිණුම් සටහන් හා ඊට අදාලව පවත්වාගෙන යනු ලබන ලේඛන අතර රු.712,600 ක වෙනසක් විය.

1.3.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

එකතුව රු.106,460 ක්වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 03 ක් වර්ෂ ගණනාවක සිට පවතින අතර එම ශේෂ හඳුනාගෙන නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

එකතුව රු.2,444,658 ක්වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 04 ක් වර්ෂ ගණනාවක සිට පවතින අතර එම ශේෂයන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය රු.88,010,893 ක් වූ සහ අවසාන ශේෂය රු.185,068,164 ක් වූ ලෙජර් ගිණුම් 09 ක් පිළියෙල කර නොතිබුණි.

(ආ) ජ´නල් සටහන් 27 කට අදාල රු.146,586,169 ක් ලෙජර් ගිණුම්වලට පිටපත් කර නොතිබුණි.

(ඇ) කුලී ආදායම් ලෙස ලෙජර් ගිණුම්වල දක්වා තිබූ රු.96,600 ක් සම්බන්ධව කිසිදු ලේඛනයක් ඉදිරිපත් නොකෙරුණි.

1.3.6 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු
------------------------------------------------------------
පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ෂ කිහිපයක සිට නිරවුල් නොවී පැවති ගිණුම් ශේෂ 03 ක් හදුනාගෙන නිරවුල් කිරීමක් සිදු නොකර එම ශේෂ වලට අදාලව සමාලෝචිත වර්ෂය තුළදී සමුච්චිත අරමුදලට රු.894,478 ක් හර සහ රු.2,803,643 ක් බැර කර තිබුණි.

(ආ) උසාවි නියෝගයක් මත 2011 වර්ෂයේ සිට අත්හිටුවා ඇති බැංකු ගිණුමේ ශේෂය නිවැරදි කිරීම සඳහා රු.311,769 ක් සමුච්චිත අරමුදල හරකර ලංකා බැංකු ගිණුම බැර කර තිබුණි.

2 මූල්‍ය සමාලෝචනය
----------------------
2.1 මූල්‍ය ප්‍රතිඵලය
----------------
ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,138,909 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,998,823 ක් විය.

2.2 මූල්‍ය පාලනය
-----------------
බැංකු ජංගම ගිණුම් 02 ක රු. මිලියන 7 කට අධික මුදලක් වර්ෂය පුරා ඌණ උපයෝජිතව පැවති අතර එම මුදල් ඵලදායී ආයෝජනයක යෙදවීමට කළමනාකරණය අපොහොසත්වී තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය වටිනාකම | 2017 වර්ෂයේ බිල්කල ආදායම වටිනාකම | 2017 රැස්කල ආදායම | | 2017 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම වටිනාකම |
|---|---|---|---|---|---|
| | | | 2017.01.01 හිඟයෙන් වටිනාකම | 2017 බිල්කල මුදලින් වටිනාකම | |
| | රු. | රු. | රු. | රු. | රු. |
| වෙළඳ බලපත්‍ර | | 805,000 | | 812,405 | - |
| කඩකුලී | 580,200 | 544,200 | 202,710 | 562,200 | 115,250 |
| සතිපොළ | 2,426,000 | 2,427,570 | 62,275 | 3,821,472 | |
| මස්කඩ | 455,665 | 473,600 | - | 475,620 | 59,270 |
| වංචල වත්කම් කුලියට දීම | - | 900,000 | - | 4,266,218 | 75,600 |
| වීථි රේඛා | - | 200,000 | - | 189,800 | - |
| වැලි ප්‍රවාහන | - | - | - | 20,500 | - |
| දැන්වීම් පුවරු | - | 14,000 | - | 7,100 | - |
| ජල සම්බන්ධතා ලබාදීම | - | 3,500,000 | - | 2,036,805 | - |
| විකුණුම් ජල ඉල්ලුම්පත් | - | 40,000 | - | 21,100 | - |
| ජලය | - | - 75,000 | - | 70,887 | - |
| පුස්තකාල | - | 17,000 | - | 26,135 | - |
| වරිපනම් | 1,846,824 | 1,717,920 | 4,791,516 | 1,820,537 | 4,847,111 |
| එකතුව | 5,308,689 | 10,714,290 | 5,056,501 | 14,130,779 | 5,097,231 |

2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

--------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ ලේකම්වරයා ලබාදුන් ආදායම් රැස් කිරීමේ කාර්යසාධන වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායම රු.10,714,290 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනයේ එය රු.18,510,274 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.7,795,985 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඊට හේතු පැහැදිලි කර නොතිබුණි.

(ආ) සභාවේ ලේකම්වරයා ලබාදුන් ආදායම් රැස් කිරීමේ කාර්යසාධන වාර්තාවට අනුව 2017 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් රු.1,847,824 කින් රු.4,791,516 ක්ද, වර්ෂයේ බිල්කළ වරිපනම් රු.1,717,920 කින් රු.1,820,537 ක් සමාලෝචිත වර්ෂයේ තුළ රැස් කරගෙන ඇති බව දක්වා තිබුණු අතර වර්ෂය අවසානයේ තවදුරටත් අයකළ යුතු හිඟ වරිපනම් වටිනාකම රු.4,847,111 ක් ලෙස දැක්වීමෙන් ලේකම්වරයා ලබාදුන් ආදායම් රැස් කිරීමේ කාර්යසාධන වාර්තාවේ දක්වා ඇති වටිනාකම් සාවද්‍ය බව නිරීක්ෂණය විය.

2.3.3 වරිපනම් බදු

--------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 වර්ෂයේ ගාස්තු සම්බන්ධ ගැසට් නිවේදනය ප්‍රකාරව වරිපනම් බදු ආදායම ලෙස වාර්ෂික තක්සේරු වටිනාකමින් සියයට 10 ක් ගණනය කළ යුතු වුවත් වර්ෂයේ වරිපනම් බදු ආදායම රු.83,425 ක් අඩුවෙන් ගණනය කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.4,847,110 ක හිඟ වරිපනම් බදු පැවති අතර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාර කටයුතු කර හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.4 කඩකුලී

---------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩකුලී රු.115,250 ක් වූ අතර, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 වගන්තිය ප්‍රකාර කටයුතු කර හිඟ මුදල් අයකරගෙන නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්යසාධනය

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා, විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 126වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28ක් ඉටුකිරීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017දෙසැම්බර් 31වනවිටත් එකී කාරණා ඉටු කිරීමට අදාලව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

------------------------

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ඉටුකර යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

------------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030න්‍යායපත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉඩම් හා ගොඩනැගිලි යටතේ වත්කම් 17 ක් දක්වා තිබුණද වත්කම් 09 කට අදාල පිරිවැය රු.79,828,802 ක් දක්වා තිබුණි. සෙසු වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉඩමේ ප්‍රමාණය හෝ වටිනාකම හඳුනා නොගත් ඉඩම් 05 ක් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

3.3 මානව සම්පත් කලමනාකරණය

------------------------------------

සභාවේ සේවයේ යෙදී සිට විශ්‍රාම ගිය හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් වර්ෂ 01 සිට වර්ෂ 06 දක්වා කාලයක් සිට අයවිය යුතුව තිබුණු රු.26,217 ක සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ආදායම් රැස්කල හැකි කඩකාමර 35 ක් ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව සතු වූ අතර, ඉන් කඩ කාමර 04 ක් කුලී පදනම මත ලබාදීමට අපොහොසත් වීමෙන් රු.72,000 ක ආදායම අහිමි වී තිබුණි.

(ආ) එළ ගවමස් හල මාස 02ක වාරික නොගෙවීම මත වසා දැමීමට කටයුතු කර තිබූ අතර හිග බදුකුලී රු.59,270 ක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මුදලින් ලැබී තිබුණ  බර වාහන හා යන්ත්‍ර ආදායම් පමණක් සැලකිල්ලට ගෙන තිබූ අතර වෙනත් ණයහිමියන් සඳහා හිලව් කර තිබුණු රු.283,100 ක් සහ පළාත් පාලන මාර්ග නවීකරණ ව්‍යාපෘතිය වෙනුවෙන් බරවාහන හා යන්ත්‍ර යෙදවීම වෙනුවෙන් වූ රු.588,000 ක් ආදායම් ලෙස හදුනාගෙන නොතිබුණි.

3.5 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම
-----------------------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් නොතිබුණි.

4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය
------------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය
--------------------------

උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 4/2015 චක්‍රලේඛයේ 06 වන ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර තිබුණු නමුත් අභ්‍යන්තර විගණන වාර්තා නිකුත් කර නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු
--------------------------------------

මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජුනි 09 දිනැති අංක GMA 2009/01 චක්‍රලේඛය ප්‍රකාර විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර ක්‍රියාත්මක කර නොතිබුණි.

5 පද්ධති හා පාලන
-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර තිබූ අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) අයවැය පාලනය | (i) ඇස්තමේන්තුගත ආදායම් අයකර නොගැනීම.<br>(ii) ඇස්තමේන්තුවලට අදාලව වියදම් පාලනය සිදුනොකිරීම. |
| (ආ) ගිණුම්කරණය | (i) ගිණුම් පොත්පත් ලේඛන යාවත්කාලීනව නොපැවැත්වීම.<br>(ii) පොදු ලෙජරය තුලනය නොකිරීම. |
| (ඇ) වත්කම්/ දේපල | (i) වත්කම් තක්සේරු කර ගිණුම්ගත නොකිරීම.<br>(ii) ආරක්ෂාව තහවුරු නොකිරීම. |